# ඊශ්‍රායලයේ වෙසෙන ශ්‍රී ලාංකික ඔබට විශේෂ පණිවිඩයක්..

## ආරක්ෂක සයිරනය (Siren) නාද වීමේදී අනුගමනය කල යුතු ආරක්ෂිත පියවරයන්....

### ඔබ සිටින්නේ ගොඩනැගිල්ලක් තුල නම්,

ආරක්ෂක සයිරනය නාද වීමට පටන් ගත් වහාම එහි තිබෙන ආරක්ෂිත කාමරය (Safe room) තුලට ගොස් එහි දොර ජනෙල් සියල්ල හොඳින් වසා ගත යුතුය.

ආරක්ෂිත කාමරයක් නොමැති නම් ඔබ සිටින නිවස තුල අවම දොර ජනෙල් සහිත කාමරයක් තුලට ගොස් බිම වාඩිවී සිටිය යුතුය. එසේ සිටීමේදී දොර හා ජනෙල් දෙසට මුහුණලා නොසිටිය යුතුය.

එසේත් නොමැති නම් ඔබ සිටින ගොඩනැගිල්ලේ දෙවන මහලේ පඩිපෙළ මත වාඩි වී සිටිය යුතුය.

### ඔබ සිටින්නේ එළිමහනක නම්,

ආසන්නයේම ඇති ගොඩනැගිල්ලකට ඇතුළු විය යුතුය.

ඔබ ආසන්නයේ ගොඩනැගිල්ලක් නොමැති නම් සිටින ස්ථානයේම බිම දිගා වී දෑත් හිස මත තබා ගත යුතුය.

### ඔබ සිටින්නේ වාහනයක් තුල නම්,

වාහනයෙන් ඉවත් වී ලගම ඇති ගොඩනැගිල්ලක් තුලට යා යුතුය.

ඔබ ආසන්නයේ ගොඩනැගිල්ලක් නොමැති නම් වාහනයෙන් ඉවත් වී බිම දිගා වී දෑත් හිස මත තබා ගත යුතුය.

**පිපුරුම් ශබ්දයෙන් පසු/ සයිරනය (Siren) නාද වීම අවසන් වූ පසු විනාඩි 10ක කාලයක් සිටින ස්ථානයේම රැඳී සිටීමෙන් අනතුරුව එම ස්ථාන වලින් ඉවත්ව යාම සුදුසුය.**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - ඊශ්‍රායලය